# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2261/54 - 2022 ජනවාරි මස 06 වැනි බ්‍රහස්පතින්දා - 2022.01.06**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.-බී. 3/2013 (ii)

**1971 අංක 52 දරන වෙළඳ නැව් පනත**

1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 139 වන වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 321 වන වගන්තිය යටතේ වරාය හා නාවික අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

**රෝහිත අබේගුණවර්ධන,**
වරාය හා නාවික අමාත්‍ය,

2021 දෙසැම්බර් මස 29 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. (1) මේ නියෝග 2021 අංක 06 දරන වෙළඳ නැව් (යාත්‍රා කිරීමේ සුරක්ෂිත බව) නියෝග යනුවෙන් හඳුන්වනු ලබයි.

(2) 1974 මුහුදේ දී ජීවිතාරක්ෂාව සඳහා වූ ජාත්‍යන්තර සම්මුතියේ V වන පරිච්ඡේදය, කලින් කලට සංශෝධිත පරිදි වන 1988 ප්‍රොටොකෝලය සහ එම ප්‍රොටොකෝලයට පසුව සිදු කරනු ලබන සංශෝධන බලාත්මක කිරීම මේ නියෝගවල කාර්යය විය යුතු ය.

I වන කොටස

**මේ නියෝගවල අදාළත්වය සහ යාත්‍රා කිරීමේ සුරක්ෂිත බව**

2. (1) මේ නියෝගයේ (2) වන, (3) වන, (4) වන, (5)වන, (6) වන සහ (7) වන අනු නියෝගවල විධිවිධාන වලට යටත්ව, ටොන් බර හා ඉදිකිරීමේ දිනය අදාළ වන්නා වූ මේ නියෝග (මේ නියෝගවල "සම්මුතිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1974 මුහුදේ දී ජීවිත ආරක්ෂා කිරීම පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ සහ 1988 ප්‍රොටොකෝලයේ අදාළ නියෝග, කවර හෝ තැනක තිබිය හැකි ජාත්‍යන්තර මුහුදු ගමන්වල නිරතවන ශ්‍රී ලංකා ධජය දැරීමට හිමිකම් ඇති නැව්වලට සහ ශ්‍රී ලංකා ජල තීරයේ ගමන් කරන වෙනත් යම් විදේශීය නැව් වලට අදාළ විය යුතු ය.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(2) සම්මුතියේ අන්‍යාකාරයකින් ප්‍රකාශිතවම විධිවිධාන සලස්වා ඇති පරිදි හැර, මේ නියෝග, යුද නැව්, නාවික ආධාරක සහ ගිවිසුම්කාර රාජ්‍යයන් විසින් හිමිකාරිත්වය දරන හෝ මෙහෙයවනු ලබන සහ රජයේ වාණිජමය නොවන සේවා සඳහා පමණක් භාවිත කරනු ලබන නැව්වලට අදාළ නොවිය යුතු ය.

(3) සම්මුතියේ V වන පරිච්ඡේදයේ අන්‍යාකාරයකින් ප්‍රකාශිතවම විධිවිධාන සලස්වා ඇති පරිදි හැර, මේ නියෝගවල විධිවිධාන, හුදෙක්ම උතුරු ඇමෙරිකාවේ මහා විල් සහ එම විල්වල කැනඩාවේ කියුබෙක් පළාතේ මොන්ට්‍රියල් හි ශාන්ත ලැම්බර්ට් ලොක් හි පහළ පිටවීම දක්වා නැගෙනහිරට සම්බන්ධ වන සහ අතු ගංගාවල යාත්‍රා කරනු ලබන ශ්‍රී ලාංකික නැව්වලට අදාළ නොවිය යුතු ය.

(4) මේ නියෝග, 2017 මැයි 4 වන දිනැති අංක 2017/31 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද 2017 වෙළෙඳ නැව් (කුඩා වාණිජ යාත්‍රා) නියෝග අදාළ වන්නා වූ අවස්ථාවක දී නැව් වලට අදාළ නොවිය යුතු ය.

(5) සම්මුතියේ **v** වන පරිච්ඡේදයේ 19 වන සහ 20 වන නියෝග, සම්මුතියේ v වන පරිච්ඡේදයේ 18 වන නියෝගයේ 1 සිට 3 දක්වා වන ඡේද සහ 7 වන සහ 8 වන ඡේද, පද්ධති සහ උපකරණවලට ඒවා අදාළ වන තාක් දුරට යම් මුහුදු ගමනක යෙදෙන දළ ටොන් බර 150 ට අඩු නැව් සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

(6) සම්මුතියේ v වන පරිච්ඡේදයේ 19 වන නියෝගයේ 2.2.3 වන ඡේදය, යම් මුහුදු ගමනක යෙදෙන දළ ටොන් බර 150 ට අඩු නැවකට හෝ ජාත්‍යන්තර මුහුදු ගමනක නොයෙදෙන දළ ටොන් බර 500 ට අඩු නැවකට අදාළ නොවිය යුතු ය.

(7) සම්මුතියේ v වන පරිච්ඡේදයේ 23 වන නියෝගය-

(අ) යම් මුහුදු ගමනක යෙදෙන දළ ටොන් බර 150 ට අඩු නැව්වලට; සහ

(ආ) ජාත්‍යන්තර මුහුදු ගමන්වල නොයෙදෙන දළ ටොන් බර 500ට අඩු නැව්වලට;

අදාළ නොවිය යුතු ය.

එසේ වුවද, නාවික නියමුවකු සේවයෙහි යොදවා ඇති අවස්ථාවල දී එවැනි නැව් මුහුදු ගමනේ යොදවනු ලැබ තිබිය යුතු ය.

3. (1) (මේ නියෝගවල "අධ්‍යක්ෂ-ජනරාල්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙළඳ නැව් අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, යාන්ත්‍රික ප්‍රචලන ක්‍රම නොමැති නැව් සඳහා, සම්මුතියේ v වන පරිච්ඡේදයේ 15, 17 සිට 19 දක්වා (19 වන නියෝග යේ 2.1.7 වන ඡේදය හැර), 20, 22 සහ 24 සිට 28 දක්වා වන නියෝගවල දක්වා ඇති සියලු විධිවිධානවලින් හෝ යම් විධිවිධානවලින් නිදහස් වීම් ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

(2) (3) වන අනු නියෝගයේ විධිවිධානවලට යටත්ව, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්-

(අ) නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් නියමයන් මත, (නිදහස් කිරීමේ සහතිකයේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි පරිදි) මේ නියෝගවල සියලු විධිවිධාන හෝ යම් විධිවිධාන අදාළ කර ගැනීමෙන් නිදහස් වීම් ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

(ආ) අවම වශයෙන් නියෝගවල දක්වා ඇති නියමයන් හි කාර්යය සඳහා ඵලදායී වන බවට, විභාග කිරීමක් මගින් හෝ අන්‍යාකාරයකින් සෑහීමකට පත් වන්නේ නම්, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් යම් නැවත සවි කිරීම හෝ ඒ තුළ ගෙනයාම සඳහා යම් සවිකිරීමක්, ද්‍රව්‍යයක්, උපකරණයක් හෝ මෙවලමක් හෝ යම් විශේෂ සවිකිරීමක්, ද්‍රව්‍යයක්, උපකරණයක් හෝ මෙවලමක් වෙනුවට නැව තුළ වෙනත් යම් සැපයීමක් සිදු කිරීම සඳහා හෝ මෙම නියෝග යටතේ නියම කර ඇති සැපයීමක් සඳහා අවසර දෙනු ලැබිය හැකි ය.

(3) (2) වන අනුනියෝගයේ කාර්යය සඳහා, නැවේ සිට වෙරළ දක්වා ඇති උපරිම දුර, මුහුදු ගමනේ දුර සහ ස්වාභාවය, සාමාන්‍ය යාත්‍රා කිරීමේ උපද්‍රව නොමැති බව සහ සුරක්ෂිතතාවයට බලපානු ලබන වෙනත් තත්ත්වයන් මත සම්මුතියේ V වන පරිච්ඡේදය සම්පූර්ණයෙන් අදාළ කර ගැනීම අවශ්‍ය නොවීම හෝ එසේ අදාළ කර ගැනීම අයුක්ති සහගත හෝ අනවශ්‍ය වන අවස්ථාවක දී, නැව මුහුදු ගමනක යෙදෙන බව අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් තෘප්ත කළ යුතු අතර එවැනි යම් නිදහස් කිරීමක් හෝ අවසර ලබා දීමක් මගින් වෙනත් නැව්වල සුරක්ෂිතතාවයට ඇති විය හැකි බලපෑම පිළිබඳ අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් සලකා බැලිය යුතු ය.

(4) නිශ්චිතව දක්වනු ලැබිය යම් නියමයන් මත, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නැව් පන්තිවලට හෝ තනි නැව්වලට, සම්මුතියේ V වන පරිච්ඡේදයේ 18, 19, 19-1 හෝ 20 වන නියෝගවල නියමයන් වලින් නිදහස් වීම් ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

(5) නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් නියමයන් මත, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, අසම්මුතික සැලැස්මක නැව්වලට සම්මුතියේ V වන පරිච්ඡේදයේ 22 වන නියෝගයේ නියමයන් වලින් නිදහස් වීම් ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

(6) නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් නියමයන් මත, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, සම්මුතියේ V වන පරිච්ඡේදයේ 26 වන නියෝගයේ 1 වන සහ 2 වන ඡේදවල නියමයන්වලින් නිදහස් කිරීම්, නිතිපතා පැය විසි හතරට අඩු කාලයක් ගතවන මුහුදු ගමන්වල යෙදෙන සහ යටත් පිරිසෙයින් සෑම සතියකට වරක්වත් එම ඡේදවලින් නියම කරනු ලබන පරීක්ෂා කිරීම් සහ අත්හදා බැලීම් සිදු කරනු ලබන නැව්වලට ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

(7) 2022.01.06 දිනැති අංක 2261/49 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලබන 2021 අංක 01 දරන වෙළෙඳ නැව් (සමීක්ෂණ සහ සහතික) නියෝග අදාළ වන නැවකට නිදහස් කිරීමක් ප්‍රදානය කරනු ලබන අවස්ථාවක දී, එය එකී නියෝගවලට අනුකූලව නිකුත් කරනු ලැබිය යුතු ය.

(8) (අ)2022.01.06 දිනැති අංක 2261/49 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලබන 2021 අංක 01 දරන වෙළෙඳ නැව් (සමීක්ෂණ සහ සහතික) නියෝග අදාළ නොවන නැව්වලට මේ නියෝග යටතේ යම් නිදහස් කිරීමක් ප්‍රදානය කරනු ලබන අවස්ථාවක දී, මේ නියෝගවල (2) (ආ) වන අනුනියෝගය යටතේ දෙනු ලබන අවසර ලබා දීමක් හෝ (ආ) ඡේදය යටතේ සිදු කරනු ලබන යම් වෙනස් කිරීමක් හෝ අවලංගු කිරීමක්-

(i) ලිඛිතව විය යුතු ය;

(ii) එය ක්‍රියාත්මක වන දිනය නිශ්චිතව දැක්විය යුතු ය; සහ

(iii) යම් නිදහස් කිරීමක් සම්බන්ධයෙන් වන විට දී, එය ලබා දී ඇත්තේ කුමන නියමයන් මත ද යන්න නිශ්චිතව දැක්විය යුතු ය.

(ආ) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, සාධාරණ දැන්වීමක් ලබා දීමෙන් පසුව, මේ නියෝගය යටතේ ප්‍රදානය කරන ලද යම් නිදහස් කිරීමක් හෝ දෙන ලද යම් අවසර ලබා දීමක් වෙනස් කිරීම හෝ අවලංගු කිරීම සිදු කරනු ලැබිය හැකි ය.

(ඇ) 2022.01.06 දිනැති අංක 2261/49 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලබන 2021 අංක 01 දරන වෙළෙඳ නැව් (සමීක්ෂණ සහ සහතික) නියෝග අදාළ නොවන නැව්වලට ප්‍රදානය කරනු ලබන යම් නිදහස් කිරීමක්, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකෘතියකින් විය යුතු ය.

4. අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්,-

(අ) එකී විධිවිධානය සමඟ අනුකූල වීම අදාළ නැව් පන්තිය හෝ තනි නැව සඳහා ප්‍රයෝගික නොවන බවට හෝ යුක්ති සහගත නොවන බවටත හෝ

(ආ) නිදහස් කිරීම, යටත් පිරිසෙයින් සම්මුතියේ නියමන්ට සමාන මට්ටමක සුරක්ෂිතතා මට්ටමක් සලස්වන්නා වූ යම් කොන්දේසි සහ සීමා කිරීම් වලට යටත් වන බවට;

සෑහීමකට පත් වන්නේ නම් මිස, මේ නියෝග යටතේ යම් නිදහස් කිරීමක් ප්‍රදානය කරනු නොලැබිය යුතු ය.

5. (1) සම්මුතියේ V වන පරිච්ඡේදයේ නියෝගයක පරිපාලනයේ අනුමැතිය අවශ්‍ය වන යමක් සඳහන් වන අවස්ථාවක දී, පරිපාලනය සෑහීමකට පත් කිරීම හෝ පරිපාලනය විසින් පිළිගත හැකි බවට පත් කිරීම සඳහා, අධ්‍යක්ෂ-ජනරාල්වරයා හෝ අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් බලය ලබා දී ඇති යම් තැනැත්තකු විසින්, සම්මුතියේ V වන පරිච්ඡේදයේ විධිවිධානවලට අනුකූලව ශ්‍රී ලාංකික නැවක් සම්බන්ධයෙන් එවැනි කාරණයක් සඳහා අනුමැතියක් ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

(2) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් හෝ අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් බලය ලබා දී ඇති තැනැත්තකු විසින් සාධාරණ දැන්වීමක් ලබා දීමෙන් පසුව, මේ නියෝගය යටතේ දෙන ලද යම් අනුමැතියක නියමයන් අවලංගු කිරීම හෝ වෙනස් කිරීම, පිළිවෙලින් අධ්‍යක්ෂ-ජනරාල්වරයා හෝ බලයලත් තැනැත්තා විසින්, සිදු කරනු ලැබිය හැකි ය.

(3) (1) වන අනු නියෝගය යටතේ දෙන ලද අනුමැතියක් හෝ (2) වන අනු නියෝගය යටතේ සිදු කරන ලද වෙනස් කිරීමක් හෝ අවලංගු කිරීමක්-

(අ) ලිඛිතව විය යුතු ය;

(ආ) එය ක්‍රියාත්මක වන දිනය නිශ්චිතව දැක්විය යුතු ය; සහ

(ඇ) අනුමැතියක් සම්බන්ධයෙන් වන විට දී, එය ලබා දී ඇත්තේ කුමන කොන්දේසි මත ද යන්න (තිබේ නම්) නිශ්චිතව දැක්විය යුතු ය.

## II වන කොටස

## යාත්‍රා කිරීමේ සුරක්ෂිත බව පිළිබඳ නියමයන්

6. (1) මේ නියෝගයේ (3)වන අනු නියෝගයේ විධිවිධානවලට යටත්ව, මේ නියෝග අදාළ වන නැවක් (2) වන ඡේදයේ සඳහන් කරන ලද යම් නියමයන්ට, එහි විස්තර කර ඇති නැවක් සම්බන්ධයෙන් අදාළ වන ආකාරයට ම අනුකූල විය යුතු ය.

(2) එකී නියමයන් වනුයේ, සම්මුතියේ V වන පරිච්ඡේදයේපහත දැක්වෙන නියෝගයන් හෝ නියෝගයන්හි ඡේදවල දක්වා ඇති නියමයන් වේ-

(අ) 7 වන නියෝගයේ 3 වන ඡේදය;

(ආ) 10 වන නියෝගයේ 7 වන ඡේදය;

(ඇ) 11 වන නියෝගයේ 7 වන ඡේදය;

(ඈ) 14 වන නියෝගයේ 3 වන සහ 4 වන ඡේද;

(ඉ) 17 වන නියෝගයේ 2 වන සහ 3 වන ඡේද;

(ඊ) 18 වන නියෝගයේ 1 සිට 3 දක්වා වන සහ 7 සිට 9 දක්වා වන ඡේද;

(උ) 19 වන නියෝගය;

(ඌ) 19-1 වන නියෝගයේ 2 වන සහ 4 සිට 7 දක්වා වන ඡේද;

(එ) 20 වන නියෝගයේ 1 වන සහ 2 වන ඡේද;

(ඒ) 21 සිට 30 දක්වා වන නියෝග;

(ඔ) 31 වන නියෝගයේ 1 සහ 4 වන ඡේද;

(ඕ) 32 වන නියෝගයේ 1 වන, 2 වන, 4 වන සහ 5 වන ඡේද;

(ක) 33 වන නියෝගයේ 1 වන, 2 වන, 3 වන, 4 වන සහ 6 වන ඡේද;

(ග) 34 වන නියෝගය;

(ච) 34-1 වන නියෝගය; සහ

(ජ) 35 වන නියෝගය.

(3) මේ නියෝග අදාළ වන නැවක්, වෙළඳ නැව් පනතේ 321අ වන වගන්තිය යටතේ නිකුත් කරන ලද ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතීන්හි නිශ්චිතව දක්වා ඇති පරිදි යම් නියමයන් තිබේ නම්, එකී නියමයන්ට, අවස්ථාවෝචිත පරිදි, විකල්පීය වශයෙන් හෝ අතිරේක වශයෙන් අනුකූල විය යුතු ය.

(4) සැකදුරු කිරීම සඳහා, මේ නියෝගයේ (2) වන අනු නියෝගයේ සඳහන් කරන ලද යම් නියමයක්, පාදක සටහනක් ඇති විධිවිධානයක දක්වා ඇති අතර, පාදක සටහනේ, හෝ පාදක සටහනේ සඳහන් කරන ලද යෝජනා සම්මතයේ, චක්‍රලේඛවල හෝ ලේඛනයේ අන්තර්ගතය මගින් නියමයේ කොටසක් සකස් කිරීම අදහස් වන බව වචන පෙළගැස්මෙන් සහ සන්දර්භයෙන් පැහැදිලි වන අවස්ථාවක දී ඒ අනුව එම අන්තර්ගතය නියමයේ කොටසක් වශයෙන් සලකනු ලැබිය අතර මේ කාර්ය සඳහා "පාදක සටහනක්" යනු සම්මුතියේ V වන පරිච්ඡේදයේ අන්තර්ගතය තුළ පාදක සටහනක් ලෙස හඳුනාගනු ලබන සටහනක් වේ.

7. නැවක අයිතිකරු සහ නෞකාධිපතිවරයා විසින්, සම්මුතියේ V වන පරිච්ඡේදය මගින් නියම කරනු ලබන උපකරණවල ක්‍රියාකාරිත්වය පවත්වාගෙන යනු ලබන බව තහවුරු කිරීම සඳහා ප්‍රමාණවත් වැඩපිළිවෙලක් සකස් කරනු ලැබිය යුතුය.

8. ශ්‍රී ලංකාවේ පිහිටි යම් වරායක හෝ යම් ස්ථානයක ඇති යම් නැවක්, එවැනි නැවක නැව් බඳේ, උපකරණවල, යන්ත්‍ර සූත්‍රවල දෝෂ සහගත තත්ත්වයක්, සේවක පිරිස අඩු බව, අධිකව පැටවීම හෝ නුසුදුසු පැටවීම හේතුවෙන් හෝ සම්මුතිය සමග අනුකූල නොවන වෙනත් යම් තත්ත්වයක් හේතුවෙන්, අනාරක්ෂිත නැවක් ලෙස හඳුනා ගනු ලබන අවස්ථාවක දී, සහ එකී නැව සිදු කිරීමට අදහස් කරන සේවයේ ස්වභාවය අනුව, මිනිස් ජීවිතවලට බරපතල හානි සිදු නොකරමින් මුහුදට ගමන් කිරීමට නොහැකි වන යම් අවස්ථාවක දී, එහි දෝෂ සහගත තත්ත්වය සමීක්ෂණය කිරීමේ හෝ එම දෝෂය නිවැරදි කිරිමේ කාර්යය සඳහා එකී නැව තාවකාලික රඳවා තබා ගනු ලැබිය හැකි ය.

EOG 01 - 0246

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.